ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1986 අංක 26 දරන

# විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 05 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 සැප්තැම්බර් මස 05 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැකිය

මිල : ශත 30 යි. තැපැල් ගාස්තුව : ශත 75 යි.

## 1986 අංක 26 දරන විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1986 සැප්තැම්බර් මස 05 වන දින.]

එල්. ඩී.—ඕ. 74/84

### විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

කෙටි නාමය.

1. මේ පනත 1986 අංක 26 දරන විෂ වර්ග, අබිං සහ අන්තරාය දායක ඖෂධ වර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

218 වන අධිකාරයේ 35 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥා පනතේ 35 වන වගන්තියෙහි (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

"(1) ලියාපදිංචි පාරිභෝගිකයන් හෝ ලියාපදිංචි ආයුර්වේද වෛද්‍යවරුන් හෝ වෙත, අධ්‍යක්ෂවරයා විසින්, සිය අභිමතය පරිදි, දළ හෝ සකස් කරන ලද අබිං මේ පනතෙහි විධිවිධාන සලසා ඇති පරිදි, බෙදා දෙනු ලැබිය හැකි ය.

(2) එම බෙදා දීම—

(අ) අධ්‍යක්ෂවරයා විසින් අබිං නිලධරයන් ලෙස විශේෂ යෙන් ම පත් කරනු ලබන සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ රජයේ නිලධරයන් වන; සහ

(ආ) ආයුර්වේද කොමසාරිස්වරයා විසින් අබිං නිලධරයන් ලෙස පත් කරනු ලබන, ආයුර්වේද දෙපාර්තමේන්තුවේ සියලු රෝහල් සහ බෙහෙත් ශාලා භාර නිල ධරයන් වන

අබිං නිලධරයන් මගින් කරනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය සුළු වශයෙන් වෙනස් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයෙහි, ආයුර්වේද කොමසාරිස්වරයා විසින් පත් කරන ලද, අබිං නිලධරයකුට අදාළව අධ්‍යක්ෂවරයා පිළිබඳ සෑම සඳහන් කිරීමක් ම, ආයුර්වේද කොමසාරිස්වරයා පිළිබඳ සඳහන් කිරීමක් ලෙස, සලකනු ලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය, රු. 200 කි. කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත හැම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය